**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2014**

---

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අංක 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට ගනිමින් පැවති පිරිවැය රු.24,149,095 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 52 ක පිරිවැය රු.343,460,435 ක් වූ අතර එම අගය වැඩ අවසන් වූ ව්‍යාපෘති වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂය තුළදී මධ්‍යස්ථානය වෙත යතුරුපැදි 12 ක් එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙතින් ලැබී තිබුණු නමුත් එම වත්කම් මධ්‍යස්ථානයේ නමට පවරා අගය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථානය විසින් මිළදී ගෙන තිබුණු රු.93,455 ක් වටිනා කාර්යාලීය උපකරණ වත්කම් වශයෙන් ගිණුම්ගත කරනු වෙනුවට කාර්යාලීය උපකරණ අළුත්වැඩියා වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේදී ආපදා කළමනාකරණ ජාතික සභාවේ අරමුදල මගින් ජාතික ආරක්ෂිත දිනය සැමරීම වෙනුවෙන් රු.5,140,984 ක් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබාදී තිබුණු අතර ඊට අදාළ වියදම් තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛය | ද්විතීයන පදනම මත අනුයුක්තව සිටින නිලධාරීන් වෙත වාහන සහ ඉන්ධන දීමනාව ලබාදීමට ප්‍රථම අදාළ නිලධාරියා ස්ථිර සේවා ස්ථානයෙන් එම පහසුකම් ලබා නොගන්නා බවට ලිඛිත තහවුරුවක් ලබාගත යුතු වූවත් එසේ බඳවාගත් නිලධාරියෙකුට ලිඛිත තහවුරුවකින් තොරව මාස 05 ක කාලයක් සඳහා එම පහසුකම් ලබාදී තිබුණි. |
| (ආ) | 1993 දෙසැම්බර් 31 දිනැති අංක පීපීඒ/ 6/1/1 සහ 2010 ජූලි 09 දිනැති අංක සීඒ/1/1/16/1 ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | රජයේ නිලධාරීන් නිල විදේශ සංචාරයක යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් පසු දින 07 ක් ඇතුළත චක්‍රලේඛයේ “ඊ ඇමුණුමෙහි දක්වා ඇති ආකෘතිය අනුව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වූවත්, සමාලෝචිත වර්ෂයේදී විදේශ වැඩමුළු සහ සම්මන්ත්‍රණ 14 කට සහභාගීවූ නිලධාරීන් 07 දෙනෙකු අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 104 හා මුදල් රෙගුලාසි 110 | සමාලෝචිත වර්ෂය තුළදී මධ්‍යස්ථානය සතු වාහන 09 ක් අනතුරු 10 කට භාජනයවී තිබුණු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් හෝ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඒ පිළිබඳ විස්තර හානි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371 (2)(ආ) සහ (5) වගන්ති | (i) අත්තිකාරම් ලෙස ලබාදුන් මුදල් අදාළ කාර්යය නිමකළ විගසම පියවිය යුතු වූවත් අවස්ථා 23 කදී එකතුව රු.254,900 ක අත්තිකාරම් මුදල් මාස 02 සිට මාස 10 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද කර පියවා තිබුණි. තවද, අත්තිකාරම් ලෙස ලබාදුන් සියළුම මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වූවද සමාලෝචිත වර්ෂය අවසානයට එසේ නිරවුල් නොකළ අත්තිකාරම් මුදල්වල එකතුව රු.1,885,238 ක් විය.<br>(ii) ලබාගැනීමට අපේක්ෂිත සැපයුම හෝ සේවාව සඳහා සෘජුවම ගෙවීම් කළහැකි වූවද, දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණු වාහන අළුත්වැඩියා කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත මුදල් ප්‍රතිපාදනය කර තිබුණි. එසේ ප්‍රතිපාදනය කර තිබුණු මුදලින් රු.557,154 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.2,616,060 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,452,720 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,068,780 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මධ්‍යස්ථානයේ මෙහෙයුම් වියදම් රු.18,003,277 කින් වැඩිවී තිබුණද ආදායම රු.30,072,057 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

(අ) දිවයිනේ විවිධ ප්‍රදේශවල ගංවතුර, නායයෑම්, නියං, සුළිසුළං, වෙරළ ඛාදනය සහ සත්ත්ව ප්‍රහාර වැනි ව්‍යසන පිළිබඳව හඳුනාගෙන ඒවා අවම කිරීමට කටයුතු කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණ වශයෙන් ව්‍යාපෘති, සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රු.537,032,019 ක් විය. මධ්‍යස්ථානය විසින් ආපදා අවම කිරීම සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.538,817,431 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පිළියෙල කළ ක්‍රියාකාරී සැළැස්ම අනුව මධ්‍යස්ථානය මගින් ව්‍යාපෘති 148 ක් ක්‍රියාත්මක කළයුතු බව දක්වා තිබුණු නමුත් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සැළැස්ම අනුව ව්‍යාපෘති 108 ක් පමණක් දක්වා තිබීම හේතුවෙන් මෙම ආයතනවල ක්‍රියාකාරී සැළැසුම් සමගාමී නොවූ බව නිරීක්ෂණය විය.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ යටතේ සඳහන් කර තිබුණු සියලු ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනට කටයුතු අවසන් නොකර තිබුණු නමුත් 2014 වර්ෂය තුළදී රු.4,160,000 ක් වැය කර වැඩ අවසන් කරන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි පුංචි අප්පු ජඳුර වැවේ රළපනාව සකස් කිරීමේ ව්‍යාපෘතිය, 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුලත් කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතියකට මුදල් ප්‍රතිපාදනය ලබාදීමට ප්‍රථම විධිමත් පරිදි ව්‍යාපෘති යෝජනාවලියක් සකස්කර ඉදිරිපත් කළ යුතු වුවත් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 108 කට අදාළව ව්‍යාපාති යෝජනාවලින් ඉදිරිපත් නොකර ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු වටිනාකම රු.324,553,620 ක් විය.

(iv) මධ්‍යස්ථානය විසින් 2013 නොවැම්බර් 25 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින් ව්‍යාපෘති සඳහා අත්තිකාරම් වශයෙන් ලබාදෙන මුදල මුළු ඇස්තමේන්තු වටිනාකමින් සියයට 40 පමණක් බව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු වෙත දන්වා තිබුණි. කෙසේවුවද, මෙම සීමාව නොසලකා ව්‍යාපෘති 09 ක් සඳහා මුළු

ඇස්තමේන්තුගත මුදලින් සියයට 42 ක සිට සියයට 77 ක අතර පරාසයක අත්තිකාරම් ලබාදී තිබුණි.

(v) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ආරම්භයේදී කොන්ත්‍රාත්කරුවන් සමග ගිවිසුමකට එළඹිය යුතු වුවත්, ඇස්තමේන්තු වටිනාකම රු.230,209,426 ක් වූ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 71 ක් සඳහා ගිවිසුම් පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි.

(vi) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසුව එම මුදල් වියදම් දැරීම සඳහා වූ රික්විෂිසන් පත්‍ර, දිස්ත්‍රික් ලේකම් මුදල් ලබාගත් බවට රිසිට් පත් සහ ව්‍යාපෘති අවසන් කළ බවට වාර්තාවක් මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තු වටිනාකම රු.501,132,349 ක ව්‍යාපෘති 167 ක් සඳහා අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(vii) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා මුදල් ලබාදීමෙන් පසුව එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පරීක්ෂා කළයුතු අතර එසේම අත්තිකාරම් ලබාදුන් පසු ඉතිරි වාරික ගෙවීමේදීද, මෙම පසුවිපරම් කිරීම සිදුකළයුතු වුවත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණු දිස්ත්‍රික්ක 22 ක එසේ පසුවිපරම් සිදුකළ බවට වාර්තා ඇතුළත්වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 143 ක් ක්‍රියාත්මක කර තිබුණද විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත්, ඉන් වැය නොකළ මුදල් මධ්‍යස්ථානය වෙත ආපසු එවීමට කටයුතු කර තිබුණේ, ව්‍යාපෘති 37 ක් මඟින් පමණි. ව්‍යාපෘති 106 ක් සඳහා වියදම් වාර්තා ලබා නොගැනීම නිසා 2015 මාර්තු 31 දින වන විටත් ඉතිරි මුදල් මධ්‍යස්ථානය වෙත එවා නොතිබුණි. ඒ අනුව ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල රඳවා නොගෙන මධ්‍යස්ථානය වෙත ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මධ්‍යස්ථානය විසින් ලබාදුන් තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළදී සුළු හා මධ්‍ය පරිමාණ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යටතේ වර්ෂය අවසානයට වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 09 ක් වශයෙන් දක්වා තිබුණද, දිස්ත්‍රික් කාර්යාල 13 කින් ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවලට අනුව එම ව්‍යාපෘති 09 ට අමතරව රු.95,983,256 ක අත්තිකාරම් නිදහස් කර තිබුණු ව්‍යාපෘති 27 ක වැඩ අවසන්වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) තවද සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 03 ක ව්‍යාපෘති 20 ක් සඳහා රු.46,534,568 ක් වූ සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදලම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී තිබුණු නමුත් දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අවසන් කිරීමට අපේක්ෂිත මහා පරිමාණ ව්‍යාපෘති 03 ක කටයුතු 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා අනුව කළුතර හා පානදුර ප්‍රදේශවල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ සහ දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2015 මාර්තු මාසය වනවිටත් අවසන්කර නොතිබුණි. තවද, යාපනය අර්ධද්වීපයේ ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා විගණනය වෙත ලබාදී නොතිබුණි.

(ඈ) ආපදා අවදානම් අවම කර ගැනීමේ අරමුණින්, සෑම දිස්ත්‍රික්කයම පෙර සූදානම් සැලසුම් කිරීම මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී පෙර සූදානම් සැලසුම් කිරීම වෙනුවෙන් වැඩසටහන් 797 ක් සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.8,003,000 ක මුදලක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය කර තිබුණි. එම වැඩසටහන් සම්බන්ධයෙන් ආරම්භක අවස්ථාවේදී ක්‍රියාකාරී සැලසුම් හා වැඩසටහන අවසානයේදී කළවැඩ වාර්තාවක් සකස්කර ඉදිරිපත් කර තිබුණද, සහභාගිවූවන්ගේ ප්‍රතිචාර හා ගැටළු අවම කර ගැනීමට ඉදිරිපත් කරන ලද නිර්දේශයන් එම වාර්තාවලට ඇතුළත්වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2009 වර්ෂයේදී පාදුක්ක ප්‍රදේශයේ තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානයක් ස්ථානගත කර එහි රු.72,471,168 ක් වටිනා උපකරණ සවිකර තිබුණි. කෙසේවුවද, මෙම මධ්‍යස්ථානය 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක නොවූ අතර 2015 මැයි 15 දින වන විට එම උපකරණ ගලවා ඉවත් කර මධ්‍යස්ථානයේ ගබඩාවේ තැන්පත් කර තිබුණි.

(ආ) නෙදර්ලන්ත විදේශ ණය ආධාර යටතේ ලබාගෙන දිස්ත්‍රික්ක 14 ක් තුළ ස්ථාපනය කරන ලද සුනාමි සහ පෙර දැනුම්දීමේ සංඥා කුළුණු 77 ක් සඳහා චන්ද්‍රිකා තාක්ෂණය සම්බන්ධ කිරීම වෙනුවෙන් ඇමරිකන් සිග්නල් කෝපරේෂන් ආයතනයට වාර්ෂිකව රු. 6,778,353 ක ගාස්තුවක් ගෙවා තිබුණු නමුත් එම ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ නගර සම්බන්ධයෙන් ආපදා ප්‍රත්‍යස්ථ නගර සංවර්ධනය කිරීම හා උපාය මාර්ගික පෙර දැනුම්දීමේ ධාරිතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ විවිධ කාර්යයන් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් රු.10,260,000 ක් මධ්‍යස්ථානය වෙත සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු අතර ඉන් රු.7,410,000 ක් අදාල අවශ්‍යතාවය සඳහා යොදවා නොගෙන භාණ්ඩාගාරයට ආපසු යවා තිබුණි.

(ඈ) මධ්‍යස්ථානය විසින් හදිසි ප්‍රතිචාර සඳහා සමාලෝචිත වර්ෂය තුළ මිළදීගත් උපකරණ වලින් රු.13,193,408 ක් වටිනා උපකරණ වර්ග 13 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් බෙදාහැරීම් සිදු නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඉ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමේ කටයුතු 2015 ජූනි 30 දින දක්වා අවසන්වී නොතිබුණි.

(ඊ) සංවිධානයට අයත් රු.206,011 ක් වටිනා භාණ්ඩ තොගයක් අස්ථානගතවී වර්ෂ 07 ක පමණ කාලයක් ගතවී ඇතත් එම වටිනාකම අයකරගැනීමට හෝ කපාහැරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(උ) විනය පරීක්ෂණයකින් වැරදිකරුවන්වූ මධ්‍යස්ථානයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට රු.272,168 ක්ද, තවත් නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2014 දී රු.132,000 ක්ද, අයවිය යුතුව තිබුණු නමුත් 2015 ජූනි 30 දින දක්වාම එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මධ්‍යස්ථානය සතු වාහනයක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී අනතුරට පත්ව තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් රු.168,645 ක අලාභයක් ගණනය කර තිබුණි. එම අලාභය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී එම අනතුරට වැරදිකරු වූ නිලධාරියා වෙත දන්වා තිබුණු නමුත් 2015 ජූනි 30 දින දක්වාම අයකර ගැනීමට මධ්‍යස්ථානය අපොහොසත්වී තිබුණි.

**4.3 කාර්යය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු සංඛ්‍යාව 257 ක් වුවද තථ්‍ය තනතුරු සංඛ්‍යාව 224 ක් වීමෙන් පුරප්පාඩු 33 ක් විය. ඒ අනුව අධ්‍යක්ෂකවරයෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 07 ක්, භාෂා පරිවර්තක 02 ක් සහ සන්නිවේදන තාක්ෂණික ශිල්පීන් 03 ක් සම්බන්ධයෙන් වර්ෂ 04 කට වඩා පැවති පුරප්පාඩු පිරවීමට 2015 ජූනි 30 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ ආපදා වැළැක්වීම සහ අවම කිරිම සඳහා වූ අංශය, අධ්‍යක්ෂ (මෙහෙයුම්) සහ සහකාර කළමනාකරණ නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත වුවද, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා සහ ව්‍යාපෘතිවල පසුවිපරම් කටයුතු පරීක්ෂාවට අවශ්‍ය තාක්ෂණික නිලධාරීන් පත්කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පනත ස්ථාපිත කිරීම**

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වගන්තිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මකව තිබුණි. මෙම පනත ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සංශෝධනය කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2014 ජූනි 16 දින ඉදිරිපත් කර තිබුණි. 2015 අගෝස්තු 31 දින වනතෙක් සංශෝධිත කෙටුම්පත් පනත සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

**5.2 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම**

මෙම සැලැස්ම 2015 මැයි 31 දින තෙක්ම කෙටුම්පත් තත්ත්වයේ පැවතිණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශයක් පැවතියද ඊට විගණන නිලධාරීන් 02 ක් පමණක් අනුයුක්ත කර තිබුණු බැවින් මධ්‍යස්ථානයේ සියළුම කටයුතු ආවරණය කළහැකි වන පරිදි පුළුල් විගණනයක් සිදුකළ නොහැකිවී තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය හා සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති

(ඇ) කාර්ය මණ්ඩලය පාලනය